# CENTRAL PROVINCE CHAMBER OF ENTREPRENEURS

No. 04 A, Sangaraja Mawatha, Kandy E-mail: cpc13117@gmail.com Office : 081 222 3229
Mobile: 076 535 5904

President
Mr. Yasas Chandrasekara 0777-841875

Secretary
Mr. M.Y.A.A. Al Rasheed 0773-153834

Treasurer
Mr. P.Ramaraj 0777-798976

**Senior Vice President**
Mr. N. Amarasinghe
0770-044666

**Vice President**
Mr. N. Hettiarachchi
0773-555517

**Deputy Secretary**
Mr. C. Priyantha
0714-363420

**Deputy Treasurer**
Mr. C.K. Gamlath
0710-979674

**Organizer**
Mr. L. Handapangoda
0777-426340

**Chief Executive Director**
Mr. Jagath Hewage
0777-861273

**Executive Directors :**
Mr. Nadija Weeraratne
0777-440292
Mr A.J.A. Samarasinghe
0777-316900
Mr. M. Saleemdeen
0777-426292
Mr A.C.M. Rahuman
0777-813012
Mr M. Riza Wahid
0777-802038
Mr. M.R.R. Fawaz
0773-097970
Mr. P. Kumaradas
0773-616310
Mr. S. Thiyagarajah
0712-764162
Mr R. Bawaneethan
0777-270273
Mr. K. Wigneswaran
0777-395371
Mr. T. Kisho Kumar
0776-455888
Mr. M.S.M. Thahir
0779-795722
Mr. H.M. Faizaldeen
0717-000400
Mr. N. Mohanaraj
0777-685928
Mr. S. Hettiarachchi
0773-998932
Mr. T. Mariyasoosai
0774-186568


2025-12-08

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
අතිගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා
ජනාධිපති ලේකම් කාර්යාලය
කොළඹ

අතිගරු ජනාධිපතිතුමනි,

**"දිට්වා" සුළි කුණාටුව හමුවේ ආර්ථික ව්‍යසනයට ලක්වූ ව්‍යවසායක ප්‍රජාවට සහන ලබාදීම සම්බන්ධවයි.**

2019 දී සිදු වූ පාස්කු ඉරිදා ප්‍රහාරයත්, 2020 සිට 2022 දක්වා පැවැති කොවිඩ් වසංගතයත්, 2022 දී ඇතිවූ දරුණු ආර්ථික අවපාතයත් හේතු කොට ගෙන ශ්‍රී ලාංකික ව්‍යාපාරික ප්‍රජාව මුහුණ පෑ දැඩි ආර්ථික දුෂ්කරතා හමුවේ නැවතත් 2025 වර්ෂයේදී යම්තාක් දුරට හිස එසවීමට පටන්ගත් සැනින් 2025-11-27 වෙනි දින "දිට්වා" සුළි කුණාටුව හමුවේ ඇතිවූ දරුණු ගංවතුර සහ නායයාම් හමුවේ ව්‍යාපාරික ප්‍රජාව මුහුණ දෙමින් සිටිනුයේ පෙර නොවූ විරූ අති දුෂ්කර ආර්ථික ව්‍යවසනයකටයි. එම බලපෑමේ ස්වාභාවය පහත දක්වන්නෙමු.

01. ව්‍යාපාරික ස්ථාන මුළු මනින්ම හෝ අර්ධ වශයෙන් විනාශ වීම.

02. භාණ්ඩ තොග, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් විනාශ වීම.

03. එසේ හානිවූ භාණ්ඩ තොග, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ස්වාභාවික ආපදා නිසා ඇතිවිය හැකි හානි පූර්ණ වෙනුවෙන් රක්ෂණය කර නොතිබීම.

04. එසේ හානි වූ භාණ්ඩ තොග, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ සඳහා බැංකු ණය ලබා ගෙන තිබූ අවස්ථාවන්හිදී පවා ස්වාභාවික ආපදා නිසා ඇතිවිය හැකි හානි පූර්ණ වෙනුවෙන් රක්ෂණය කර නොතිබීම.

05. ආපදාවට ලක්වූ ව්‍යාපාර නැවත ගොඩනගා ගැනීම උදෙසා හෝ අවශ්‍ය භාණ්ඩ තොග, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ මිලදී ගැනීම සඳහා ප්‍රාග්ධනය නොමැති වීම.

CS CamScanner

06. හානියට පත් වූ ව්‍යාපාර ගොඩනැගිලි භූමිය හෝ වෙනත් දේපල ඇපයට තබා බැංකු ණය ලබාගෙන තිබීම.

07. එසේ ලබාගත් බැංකු ණය නැවත ගෙවීම සඳහා කිසිදු ආදායම් මාර්ගයක් නොමැති වීම.

08. සංචාරක කර්මාන්තයෙහි නියැලෙන ව්‍යාපාරිකයින්ගේ සමස්ථ භෝග වගාව විනාශ වීම.

09. එම භෝග වගාව සඳහා ලබාගත් බැංකුණය ගෙවීමට හැකි කිසිදු ආදායම් මාර්ගයක් නොමැති වීම.

10. රජය මඟින් ලබාදීමට අපේක්ෂිත වගා හානි රක්ෂණ වන්දිය එසේ වගාව සඳහා ලබාගත් බැංකු ණය පියවීමට ප්‍රමාණවත් වේදැයි යන සැකය.

11. තම ව්‍යාපාරයට හානි සිදු නොවුනද එම ව්‍යාපාරයන්හි සැපයුම් ජාලයන්ට දැඩි ලෙස හානි පැමිණ තිබීම.

12. එම සැපයුම් ජාලයට අයත් ව්‍යාපාරයන්ට පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හානි සිදු වීම හේතු කොට ගෙන සැපයුම් ජාල අඩපණ වීම සහ ණය පදනම් මත සිදු කරන ලද සැපයුම් සඳහා එම ණය අයකරගත නොහැකිවීම.

13. හානි සිදු නොවූ සැපයුම් ජාලයන්ට අයත් ව්‍යාපාර හානි සිදු වූ ව්‍යාපාර වෙත ලබාදුන් ණය අයකර ගැනීමට නොහැකි වීමෙන් බැංකු ණය ආපසු ගෙවීමේ දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ පෑම.

**ඉහත තත්වයන් හේතුකොට ගෙන අඩපණ වූ ජාතික ආර්ථිකයට විශාල දායකත්වයක් දක්වන ව්‍යාපාර ප්‍රජාව නැවත නගා සිටුවීම උදෙසා පහත සඳහන් පරිදි කඩිනම් සහන ලබා දෙන මෙන් ඉල්ලා සිටින්නෙමු.**

01. පූර්ණ සහ අර්ධ වශයෙන් හානි වූ ව්‍යාපාර නිසි ලෙස තක්සේරු කොට හානි පූර්ණ කර දීම.

02. එම හානිපූර්ණය සම්පූර්ණයෙන්ම රජයට කළ නොහැකි නම් ඒ සඳහා සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරිකයින්ට විදේශීය මූල්‍ය ප්‍රදානයන් ලබා දීමෙන් හෝ රජයේ ඇපවීම මත දීර්ඝ කාලීන ණය මුදලක් වසර දෙකක් පොලී රහිතව සහ ඉතිරි කාලය ඉතා සහනදායී පොලී ප්‍රතිශතයක් මත ලබාදීම.

03. බැංකු මඟින් ණය ලබාගෙන ඇති ව්‍යාපාරිකයින්ට එම ණය නැවත ගෙවීම ආරම්භ කිරීම සඳහා ද සහනදායී වසරක කාලයක් ලබා දීම.

CamScanner

04. මේ වන විටත් බැංකු මගින් ණය ලබාගෙන ඇති හානියට පත්වූ හෝ හානියට පත් නොවූ එහෙත් සැපයුම් ජාල හානිවූ කෘෂිකාර්මික, කාර්මික සහ සේවා සපයන (තොග සහ සිල්ලර) ව්‍යාපාර සඳහා සහන ලබාදිය යුතු ආකාරය පහතින් දක්වන්නෙමු.

04. I. එම ණය නැවත ගෙවීම ආරම්භ කිරීම සඳහා වසරක සහන කාලයක් ලබාදීම.

04. II. එම වසරක කාලය සඳහා කිසිදු පොලී මුදලක් අය නොකිරීම.

04. III. පූර්ණ හෝ අර්ධ හානි සිදු වූ ව්‍යාපාර බැංකු අයිරා පහසුකම් ලබාගෙන ඇත්නම් එම අයිරා පහසුකම අහෝසි කොට එම වටිනාකම මත වසර දෙකක පොලී රහිත සහ ඉතිරි කාලය සඳහා ඉතා සහනදායී පොලියක් මත බැංකු ණය පහසුකමක් දිර්ඝ කාලීනව ගෙවීමේ පදනම මත ලබා දීම.

04. IV. ව්‍යාපාරයට හානි නොවූවද සැපයුම් ජාලයන්ට හානි වූ ව්‍යාපාර ලබා ගෙන ඇති අයිරා පහසුකම් සඳහාද එම සැපයුම් ජාලයන්ට හානි පැමිණවීම නිසා අයකරගත නොහැකි ණය වටිනාකම සහ සිදුවිය හැකි පිරිවැටුම් අඩපණ වීම සැලකිල්ලට ගෙන නැවත ගෙවීම් ආරම්භ කිරීම සඳහා වසරක සහන කාලයකට යටත්ව ඉතා සහනදායී පොලියක් යටතේ දිර්ඝ කාලීන ණය මුදලක් ලබාදීම.

05. සුළු හා මධ්‍යම ව්‍යාපාරික ප්‍රජාව සතු ගබඩාවන් විනාශ වී ඇත්නම්, ඒ අය සඳහා ඔවුන් නැවත යථාතත්වයට පත්වන තුරු ගබඩා ලෙස පවත්වාගෙන යාම සඳහා රජයේ යම් ස්ථාන තිබේ නම් එම ස්ථාන ලබාදීම.

06. රජය මගින් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩපිළිවලෙහි හානි වූ ව්‍යාපාර නැවත ආරම්භ කිරීමට අදාලව හානිවූ ව්‍යාපාරිකයින්ට ප්‍රමුඛත්වයක් ලබාදීම.
උදා:- ඉඩම් ලබාදීම.

07. හානිවූ ව්‍යාපාරිකයින්ට නැවත සිය ව්‍යාපාර ආරම්භ කිරීමට රජය විසින් ලබා දීමට දැනට යෝජනා කර ඇති සහන මුදල ප්‍රමාණවත් නොවන බැවින් ඒ ඒ ව්‍යාපාර වෙන් වෙන් වශයෙන් තක්සේරු කර ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් ලබාදීම.

08. ඉදිරියේදී ව්‍යාපාර සඳහා සරල බදු ක්‍රමයක් හඳුන්වා දීම. **ඒ සඳහා අප විසින් ඉදිරිපත් කිරීමට අපේක්ෂිත යෝජනා මාලාවක් ඇති අතර, ඒ සම්බන්ධව සුදුසු පරිදි සාකච්ඡාවක් ලබා දෙන මෙන් ඉල්ලා සිටිමු.**

09. මෙවර රජය විසින් ඉදිරිපත් කල අයවැය යෝජනා අනුව 2026 අප්‍රේල් මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි එකතුකල අගය මත (VAT) බදු එකතුකර ගැනීම සඳහා අනුකූල වන වාර්ෂික මිලියන 36ක පිරිවැටුමක් සහිත ව්‍යාපාර තවත් වසරක කාලයකට නිදහස් කිරීම.

10. දැනට ව්‍යාපාර සඳහා VAT බදු ගෙවීම සඳහා අයකරනු ලබන VAT බදු ප්‍රතිශතය සියළුම ව්‍යාපාර සඳහා 10%ක ප්‍රතිශතයකින් අය කිරීම.

CamScanner

11. කර්මාන්තකරුවන්ගේ සහ ව්‍යාපාරිකයින්ගේ හානිවූ යන්ත්‍ර සූත්‍ර හා වාහන නැවත ආනයනය කිරීමේදී තීරු බදු සහනයක් ලබාදීම. (රක්ෂණ මගින් ආවරණයක් නොලැබූ අය වෙනුවෙන්)

ඉහත සඳහන් යෝජනා සම්බන්ධයෙන් කාරුණික අවධානය යොමුකොට දළ ජාතික නිෂ්පාදිතයේ සහ ජාතික ආර්ථිකයේ ප්‍රධානතම පංගු කරුවා වන සුළු, මධ්‍යම සහ මහා පරිමාණ ව්‍යාපාර, කර්මාන්ත සහ කෘෂිකර්මාන්ත නැවත නගා සිටුවාලීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගන්නා ලෙසත්, ඉහත යෝජනා කරන ලද සහන හැකි ඉක්මනින් ලබාදීමට කටයුතු කරන ලෙසත්, ඔබතුමාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

මේ පිළිබඳ ඔබතුමා සමග වැඩිදුරටත් සාකච්ඡාවක් ලබාදීමට අවස්ථාවක් ලබා දෙන ලෙස ඉල්ලා සිටින අතර, ඔබතුමාට පහසු දිනයක් සහ වේලාවක් අප වෙත දන්වන ලෙසත්, ඊට ඕනෑම අවස්ථාවක සම්බන්ධවීමට අප සූදානම්ව සිටින බවත් දන්වා සිටීමට කැමැත්තෙමු.

**මධ්‍යම පළාත් ව්‍යවසායක මණ්ඩලය සමන්විත ආයතන ව්‍යුහය,**

**01. මහනුවර සිංහල වෙළෙඳ පෙරමුණ**
**02. මහනුවර මුස්ලිම් වෙළෙඳ සංගමය**
**03. මහනුවර ද්‍රවිඩ වෙළෙඳ සංගමය**
**04. මාතලේ දිස්ත්‍රික් වාණිජ කර්මාන්ත සහ කෘෂිකර්ම මණ්ඩලය**
**05. නුවරඑළිය දිස්ත්‍රික් වාණිජ කර්මාන්ත සහ කෘෂිකර්ම මණ්ඩලය**

මෙයට
අධ්‍යක්ෂක මණ්ඩලයේ අණපරිදි

එම්.වයි.ඒ.ඒ. අල් රෂීඩ්
ප්‍රධාන ලේකම්

පිටපත් :-
01. මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර ගරු මහාචාර්ය සරත් අබේකෝන් මහතා
02. ශ්‍රී ලංකා මුදල් අමාත්‍යාංශ ලේකම් ගරු ආචාර්ය හර්ෂණ සූර්යපෙරුම මහතා
03. ශ්‍රී ලංකා මහබැංකු අධිපති ගරු ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා

CS CamScanner